# ටීකේඑස් ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ගනු ලබන නියාමන ක්‍රියාමාර්ග

දුර්වල මූල්‍ය තත්ත්වය, ඉල්ලූ විට හෝ කල් පිරිමේදී තැන්පත්කරුවන්ගේ මුදල් ගෙවීමට අපොහොසත් වීම් වාර්තා වීම සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවන ලද නියාමන අවශ්‍යතා සමග අනුකූල වීමට අඛණ්ඩව අසමත් වීම යන කරුණු සලකා බලමින් ටීකේඑස් ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනය වෙත මුදල් ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කර ඇති බලපත්‍රය අවලංගු කිරීමේ දැන්වීමක් එම පනතේ අංක 37(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය (මුදල් මණ්ඩලය) විසින් නිකුත් කරන ලදී.

තවද, මෙම නිවේදනය මුදල් ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා නිකුත් කර ඇති බලපත්‍රය අවලංගු කිරීමේ දැන්වීමක් පමණක් බව ශ්‍රී ලංකා මහ බැංකුව අවධාරණය කර සිටී. එබැවින්, බලපත්‍රය අවලංගු නොකල යුත්තේ ඇයිද යන්නට හේතු දක්වමින්, මුදල් ව්‍යාපාර පනතෙහි නියම කර ඇති කාල සීමාව තුල, බලපත්‍රය අවලංගු කිරීමේ දැන්වීම සඳහා ලිඛිතව විරෝධතා ඉදිරිපත් කිරීමේ අවස්ථාව ටීකේඑස් ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනය සතුව පවතී. ඒ අනුව, ටීකේඑස් ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනය විසින් මුදල් මණ්ඩලය වෙත ඔවුන්ගේ විරෝධතා ඉදිරිපත් කර ඇති අතර එම විරෝධතා සලකා බලා මුදල් මණ්ඩලය විසින් මුදල් ව්‍යාපාර පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව බලපත්‍රය අවලංගු කිරීමේ දැන්වීම ඉල්ලා අස්කරගත යුතුද නැතිනම් බලපත්‍රය අවලංගු කළ යුතු ද යන්න තීරණය කරනු ඇත.

මේ සම්බන්ධව වැඩිදුර තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ **011-2398806** සහ **011-2398774** යන දුරකථන අංක ඇමතීමෙන් හෝ **snbfi_querytksf@cbsl.lk** යන විද්‍යුත් තැපැල් ලිපිනය හරහා ලබා ගත හැකි බව දන්වා සිටිමු.

**අධ්‍යක්ෂ - බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව**

ශ්‍රී ලංකා මහ බැංකුව, නො. 30, ජනාධිපති මාවත, කොළඹ 01